ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුළ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලද ප්‍රතිපාදනවලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක වැඩ නිමකල රු.4,815,600 ක් වටිනා නිල සෙවන ඉදි කිරීම්, දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	වැය ශීර්ෂය අදාල වන ජනාධිපති ලේකම් කාර්යාලයෙන් අනුමැතිය ලබාගත් පසු 272 ශීර්ෂය යටතේ වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව වැඩ නිම කර ඇති බැවින් නිල සෙවන වටිනාකම ගිණුම්ගත කළයුතුය.
(ආ)	මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ පිහිටි අබලන්ව පැවති නිල නිවස රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය මඟින් 2023 වර්ෂයේ රු. 10,788,960 ක ප්‍රතිපාදන යටතේ අලුතින් ඉදිකර භාරදී තිබුණද, සමාලෝචිත වර්ෂයේ නැවත තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	ප්‍රතිපාදන ලැබී ඇත්තේ 130 වැය ශීර්ෂය යටතේ වන අතර 272 වැය ශීර්ෂය යටතේ මෙම වටිනාකම ගිණුම් ගත කිරීම සඳහාත් තක්සේරු කර ගැනීම සඳහාත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	වටිනාකම වැඩි වී ඇති බැවින් නැවත තක්සේරුවක් කර ගිණුම්ගත කළයුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු මෙම වාර්තාවේ 3.1 (අ) ඡේදයේ සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නිරීක්ෂණය නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 සැප්තැම්බර් 18 දිනැති අංක 16/2020 දරන අභ්‍යන්තර ආරක්ෂණ, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 10 ඡේදය	ප්‍රාදේශීය ලේකම්වරු විසින් අවම වශයෙන් මාස 04 කට හෝ වරක් සෑම ග්‍රාම නිලධාරි කාර්යාලයක්ම ආවරණය වන පරිදි පරීක්ෂාවට ලක් කිරීමට කටයුතු කළයුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක් ග්‍රාම නිලධාරි කාර්යාල එසේ පරීක්ෂාවට ලක්කර නොතිබුණි.	මසකට නියමිත ග්‍රාම නිලධාරි කාර්යාල ප්‍රමාණය පරීක්ෂා කිරීමට හැකි සෑම උත්සාහයක්ම දරන මෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දීමට කටයුතු කර ඇති බව.	චක්‍රලේඛය ප්‍රකාරව සෑම ග්‍රාම නිලධාරි කාර්යාලයක්ම ආවරණය වන පරිදි පරීක්ෂාවට ලක් කිරීමට සැලසුමක් සකස් කළ යුතුය.
(ආ)	2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද කාර්ය පටිපාටික රීති 01 වැනි කාණ්ඩයේ XVIII පරිච්ඡේදයේ 251 වගන්තිය	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 26 ක 2024 දෙසැම්බර් 31 දිනවන විට එකම සේවා ස්ථානයේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කල ඒකාබද්ධ සේවා නිලධාරින් 222 ක්, ග්‍රාම නිලධාරි 72 ක් හා සංවර්ධන නිලධාරින් 338 ක් සම්බන්ධයෙන් ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කර නොතිබුණි.	පෙර වර්ෂවලට සාපේක්ෂව මේ වන විට වසර 05 ඉක්මවූ නිලධාරින් විශාල ප්‍රමාණයක් ස්ථාන මාරු කර ඇති අතර, ඉතිරි නිලධාරීන්ට ද අදියරෙන් අදියර ඉදිරියේදී ස්ථාන මාරු ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	කාර්ය පටිපාටික රීති ප්‍රකාරව නිලධාරින් ස්ථාන මාරු කිරීම සඳහා වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ 2013 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද අඹන්පොල ජල ව්‍යාපෘතිය, 2018 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද අංක 425 කටුපොත සහ අංක	අඹන්පොල ජල ව්‍යාපෘතියේ මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර කටුපොත - යුනිට් 03 ව්‍යාපෘති දෙකම නිම නොකළ තත්ත්වයේ පවතී. ජාතික ප්‍රජා ජල සැපයුම්	ව්‍යාපෘති කඩිනමින් නිමකර ජනතාවගේ භාවිතය සඳහා ලබා දී අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා

406 කටුපොත යුනිට් 03 ජල යෝජනා ක්‍රම හා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වෙල්ගාල දිවා රාත්‍රී ක්‍රිඩා පිටියේ සංවර්ධන කටයුතු සඳහා පිළිවෙලින් රු.3,774,418 ක් රු.3,854,128 ක් හා රු.947,746 ක වියදමක් දරා තිබුණද, එම ව්‍යාපෘති සම්පූර්ණයෙන් නිම කර ජනතාවගේ භාවිතය සඳහා ලබාදීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටද කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව විසින් මේ වන විට එහි මූලික වැඩ ආරම්භ කරමින් පවතී. වෙල්ගාල දිවාරාත්‍රී ක්‍රීඩාපිටියේ අඩුපාඩු සති 02ක් තුළ නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස ලිඛිතව දන්වා ඇති බව.	ගැනීමට වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය.

4.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු.483,582 ක වියදමක් දරමින් අමාදහර ජල සමිතියේ පොම්පාගාරය හා මෝටරය අලුත්වැඩියා කිරීම සහ විදුලිය ලබාගැනීම යන කටයුතු සිදුකර තිබුණද, අළුත්වැඩියාකරන ලද මෝටරය සවිකර ජලටැංකිය තබා පොම්පාගාරය වෙතට ජලය ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.	ප්‍රජාමූල සංවිධානය විසින් අරමුදල් සපයා ගැනීමට උත්සාහ කරමින් පවතින අතර අරමුදල් ලද වහාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරීගේ අධීක්ෂණය යටතේ ඉතිරි වැඩ නිමකර ප්‍රජාවට ප්‍රතිලාභ ලැබෙන සේ ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂා කරන බව.	විධිමත් වැඩපිළිවෙලක් යොදා අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි තත්ත්වයට පත්කර ව්‍යාපෘති නිමකළ යුතුය.
(ආ)	2021 ග්‍රාමීය ක්‍රිඩා පිටි සංවර්ධනය සඳහා ලද රු.1,470,000 ක මුදල හා ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවෙන් ලද රු.1,016,047 ක මුදල යොදා එකතුව රු.2,486,047 ක් වැය කරමින් ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ ඉදිකළ ක්‍රිඩාපිටිය භාවිතයකින් තොරව පැවතුණි.	මෙම ඌන උපයෝජිත තත්ත්වය සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව.	අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගත් නිලධාරීන්ට පියවර ගැනීමටත්, ව්‍යාපෘතියෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට වැඩපිළිවෙලක් සැකසීමත් කළ යුතුය.

(ඇ)	2021 වර්ෂයේ සම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන ඒකාබද්ධ වැඩසටහන යටතේ ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමීය සංවර්ධන සමුපාකාර සමිතියක් වෙත රු.4,698,496 ක් වැය කර අලුත්වැඩියාකර දී තිබුණු පොදු පහසුකම් මධ්‍යස්ථානය හා ලබා දී තිබුණු උපකරණ භාවිතයකින් තොරව පැවතුණි.	2008 සිට රජය විසින් විවිධ වැඩසටහන් යටතේ ප්‍රතිපාදන වෙන් කලත් එම මධ්‍යස්ථානය ඌණ උපයෝජිතව පවතින බව.	වගකිව යුතු නිලධාරීන් යොදවා ප්‍රජාවගේ අවශ්‍යතාවයන්ට අනුකූලව සැලසුම්කරණ ව්‍යාපෘතිවලින් උපරිම ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කළ යුතුය.
(ඈ)	කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ දෙල් වගාව ප්‍රචලිත කිරීම හා අලෙවිය වෙනුවෙන් 2023 වර්ෂයේ මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඔල්ගමුව ග්‍රාම නිලධාරි වසමේ ප්‍රතිලාභියෙකු වෙත ලබාදුන් රු.324,500 ක් වටිනා ඉලෙක්ට්‍රෝනික තරාදියක්, සුළු පරිමාණ විජලන යන්ත්‍රයක්, පොලිතීන් සීලරයක් හා මධ්‍යම ප්‍රමාණයේ පිටිකොටන යන්ත්‍ර භාවිතයකින් තොරව නිශ්කාර්යව පැවතුණි.	නිෂ්පාදන සිදුකිරීමට ලබාදී ඇති සහන කාලයෙන් පසුවද ඔහු විසින් එම යන්ත්‍ර වලින් නිසි නිෂ්පාදනයක් නොකරන්නේ නම් එම උපකරණ සුදුසු වෙනත් ව්‍යවසායකයකු වෙත ලබා දීමට කටයුතු කරන බව.	ව්‍යාපෘති පිළිබඳ පසු විපරම් නොකළ නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීමත්, නිශ්කාර්ය වත්කම් සුදුසු ව්‍යවසායකයකු වෙත ලබා දීමට කටයුතු කිරීමත් කළ යුතුය.

4.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2014 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කර තිබුණු ජල නල දීර්ඝ කිරීමේ ව්‍යාපෘති 02 ක් සඳහා රු.14,373,885 ක මුදලක් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ගෙවා සමාලෝචිත වර්ෂයට වර්ෂ 10 කට අධික කාලයක් ගත වී තිබුණද, එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් දරන ලද වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.	කළුගමුව ගොන්නව පාලම දක්වා දැනට එළා ඇති නල භාවිතයට ගනිමින් හා ඇති අඩුපාඩු සකස් කිරීමේ කාර්යයන් සිදු කරමින් පවතින බව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2024 දෙසැම්බර් දන්වා ඇති බවත් එම කාර්යයන් අවසන් වූ පසු ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සම්පූර්ණ වාර්තාවක් ලබාගෙන ඉදිරිපත් කරනු ලබන බවත්.	විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු ආයතන හෝ පාර්ශව සම්බන්ධව පියවර ගැනීමටත්, කඩිනම් වැඩපිළිවෙලක් යොදා ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ප්‍රජාවට ලබා දීමත් කළ යුතුය.

4.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතුය. 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මෙම කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුව ඇත. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාර්යසාධන වාර්තාව ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සකසා නොතිබුණු අතර ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත වූ කාර්යයන් කාර්යසාධන වාර්තාව තුළින් නිරූපණය නොවුණි.	වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමේදී එය ක්‍රියාකාරී සැලැස්ම මත ඉදිරිපත්කර නොමැති අතර එය කාර්යසාධන වාර්තාව සඳහා අනුමත ආකෘතිය මත ඉදිරිපත් කර ඇති බව.	කාර්යසාධන වාර්තාව ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සකස් කළයුතුය.
(ආ)	කාර්යසාධන වාර්තාවේ 3.8 ඡේදය ප්‍රකාරව, 2024 දෙසැම්බර් 31 දිනට කේත තුනකට අදාළව පමණක් වත්කම් දක්වා තිබුණු අතර, ඉතිරි කේත හතරට අදාළ වත්කම් නොමැති බව දක්වා තිබුණු නමුත් ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල බදු දෙන ලද වත්කම් පවතින බැවින් එම වත්කම් කේත අංක 9180 යටතේ නිරූපණය කිරීමට පියවර ගෙන නොතිබුණි.	වත්කම් කේත අංක 9180 යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල බදු දෙන ලද වත්කම් පැවතියද, එම වත්කම් වල අයිතිය මේ දක්වා පවරාගෙන නොමැති බැවින් වටිනාකම තක්සේරු කිරීමට නොහැකි වී ඇති බව.	වත්කම් අයිතිය පවරාගෙන නිවැරදි තක්සේරු අගයන් ලබාගෙන වත්කම් කේත අංක අනුව නිරූපණය කිරීමට කටයුතු කළයුතුය.

4.5 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ග්‍රාමීය මාර්ග සංවර්ධනය - 2024 යටතේ මෙම වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන වෙන්කර අනුමත වූ රු.15,250,000 ක් වටිනා ව්‍යාපෘති 16 ක් වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.	මහජන නියෝජිතයින් විසින් යෝජනා අමාත්‍යාංශය වෙත යොමු කිරීමට ගතවූ කාලය අනුව අදාළ යෝජනා අනුමත කිරීම ප්‍රමාද වීම තුල, ප්‍රතිපාදන වෙන්කර ක්‍රියාත්මක වීමට කාලය ප්‍රමාණවත් නොවීම හා පැවති අයහපත් කාලගුණික තත්ත්වය	විධිමත් පරීක්ෂාවක් සිදු කර ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීමට වගකිවයුතු පාර්ශව වෙත පියවර ගැනීමටත්, ඉදිරියේදී ප්‍රතිපාදන වෙන් වූ ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක

		මෙන්ම 2024 ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කිරීම හේතු කොට ගෙන ව්‍යාපෘති 16 ක් අවසන් කිරීමට නොහැකි වූ බව.	කිරීමට වැඩපිළිවෙලක් සැකසීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රාදේශීය සංවර්ධනය- 2024 යටතේ ප්‍රාදේශීය විෂමතා අවම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘති තෝරාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ වෙන්කළ රු. 95,070,000 ක මුළු ප්‍රතිපාදන මුදලින් ප්‍රජා සංවිධාන වෙත භාණ්ඩ බෙදා දීම සඳහා පමණක් රු.46,345,000 ක් එනම්, මුළු ප්‍රතිපාදිත මුදලින් සියයට 49 ක් වෙන්කර තිබීම හේතුවෙන් වැඩසටහනින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.	ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති තෝරා ගැනීම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මට්ටමින් සිදු නොකරන ලද බැවින් භාණ්ඩ මිලදී ගැනීම් හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ජනාධිපති වැය ශීර්ෂය යටතේ දිස්ත්‍රික්කය වෙත අනුමත කරන ලද යෝජනා පමණක් ක්‍රියාත්මක කරන ලද බව.	විධිමත් පරිදි ව්‍යාපෘති හඳුනා නොගැනීම සම්බන්ධයෙන් පරීක්ෂාවක් කිරීමටත්, ප්‍රාදේශීය විෂමතා අවම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘති සැලසුම්කර ක්‍රියාත්මක කිරීමටත් වැඩපිළිවෙලක් සකස් කළයුතුය.

4.6 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 දෙසැම්බර් 29 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මිල ගණන් කැඳවා තෝරාගත් සැපයුම්කරුවෙකු වෙතින් රු. 5,404,000 ක් වැය කර මිලදී ගෙන තිබුණු මල්ටි චොපර් යන්ත්‍ර (කැබලි කිරීමේ යන්ත්‍ර) 20 ක් සමාලෝචිත වර්ෂය පුරාම භාවිතයකින් තොරව නිශ්කාර්යව පැවතුණි.	මේ වන විට වාණිජ පරිමාණයෙන් කිරි ගව පාලනයේ නිරත කිරි ගොවින්ට අවශ්‍ය සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා මෙම මල්ටිචොපර් යන්ත්‍ර යොදා ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමග සාකච්ජා කරමින් පවතින බව.	සැලසුමකින් තොරව වත්කම් මිලදී ගත් නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, සැලසුමකින් තොරව නිශ්කාර්ය වත්කම් ඵලදායී කාර්යයකට යෙදවීමට පියවර ගැනීමත් කළ යුතුය.
(ආ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් පිහිටි ඉඩම් පවරා ගැනීමේ කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 10 සිට වර්ෂ 61 ක කාලයක් ගත වී තිබුණද, එම පවරා ගැනීමේ කටයුතු අවසන්ව නොතිබුණි.	පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව.	ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කරගත යුතුයි.

(ඇ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක වාහන 23 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඌන උපයෝජිතව පැවතුණි.	එලදායි ලෙස සේවාවන් සැපයිමට යොදා නොගැනෙන බවුසර් රථ එලදායි ලෙස සේවයේ යෙදවිය හැකි පළාත් පාලන ආයතන සඳහා ලබා දීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇතත් මේ දක්වා ඒ සඳහා පිළිතුරු ලැබී නොමැති බව.	වාහන එලදායි ලෙස උපයෝජනයට යොදා ගතයුතුයි.
(ඈ)	දිස්ත්‍රික් ලෙකම් සතු ලියාපදිංචි අයිතිය අවලංගු නොකල ඩබල් කැබ් රථයක් සහ යතුරුපැදි 6 ක් 2020 පෙබරවාරි 05 දින ලංසු කැඳවා විකුණා තිබුණු අතර 2021 දෙසැම්බර් 03 දින යතුරුපැදි 04 ක් වයඹ තාක්ෂණ විද්‍යාලය වෙත ලබාදී තිබුණද, එම වාහනවල ලියාපදිංචි අයිතිය සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් වෙතම පැවතුණි.	එක් වාහනයක ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා අදාළ අකෘති ඉදිරිපත් කර ඇතත් ලියාපදිංචිය අවලංගු කළ බව දන්වා නැති බවත් වාහන 6ක M.T.A. 6 ආකෘති සම්පූර්ණ කර ගැණුම්කරුට ලබා දී ඇති බවත් වාහන 04ක ලියාපදිංචිය අවලංගු කළ බව දන්වා නැති බව.	අයිතිය පැවරීම් නිසි පරිදි අවසන් කිරීමට වගකිව යුතු නිලධාරින් කඩිනමින් කටයුතු කළයුතුය.
(ඉ)	කුරුණෑගල ප්‍රදේශයේ පිහිටි බස්රථ නැවතුම්පල, මාලිගාපිටිය, මහජන පොල, සුසාන භූමිය, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල ඉඩම, රජපිහිල්ල තානායම, රජපිහිල්ල උද්‍යානය, මහනගර සභා පරිශ්‍රය පිහිටි ඉඩම, මැගසින් හිල් ඉඩම ඇතුළුව වාණිජ වටිනාකමින් අධික ඉඩම් 28 ක් දීර්ඝ කාලීන බදු පදනම මත නගර සභාව වෙත ලබා දී රජයට විශාල ආදායමක් උපයාගත හැකිව තිබියදී කුරුණෑගල මහනගර සභාව වෙත පැවරීමට කටයුතු කරමින් පැවතුණි.	නගර සභාවට පවරා දීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව.	ඉඩම් නිත්‍යානුකූලව දීර්ඝකාලීනව බදු දීම මඟින් ආදායම් ඉපයීමට කටයුතු කළයුතුය.
(ඊ)	කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශ 13 ක, ග්‍රාම නිලධාරි වසම් 64 ක පිහිටි හෙක්ටයාර් 60.19 ක් වූ ඉඩම් හා එහි පිහිටි ගොඩනැගිලි භාවිතයකින් තොරව නිශ්කාර්යව පැවතුණි.	මහව, ඉබ්බාගමුව, නිකවැරටිය, රිදීගම, කුලියාපිටිය, පඩු/බටහිර, කොබෙයිගනේ, වාරියපොල, ගිරිබාව, උඩුබද්දාව, වීරඹුගෙදර, කොටවෙහෙර යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල වත්කම් 52 ක් නිශ්කාර්යව පවතින බව.	ඉඩම් නිත්‍යානුකූලව දීර්ඝකාලීනව බදු දීම මඟින් ආදායම් ඉපයීමට හෝ වෙනත් එලදායී ආර්ථික වාසි ලබාගත හැකි ව්‍යාපෘතියක යෙදවීමට කටයුතු කළයුතුය.

4.7 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පොතුවිල ග්‍රාම නිලධාරි වසමේ මහගල්මඩ එගොඩ නැමති ගමෙහි පිහිටි හෙක්ටයාර 30.704 ක (අක්කර 75) භූමිය වසර 30 ක් සඳහා 1999 ජනවාරි 18 දින සීමා සහිත (ජනතා) ගොවි සමාගමක් වෙත බදු දී තිබුණ අතර, සීමාසහිත (ජනතා) ගොවි සමාගමට සහල් හා පිටි නිෂ්පාදන, බීජ වී සැකසීම, එළවළු පලතුරු විජලනය හා වී මිලදී ගැනීමේ ගබඩා පහසුකම් සහිත කෘෂි නිෂ්පාදන සැකසීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 1999 වර්ෂයේ සිට වරින්වරජාතික සවිය ගම නැඟුම ව්‍යාපෘතිය යටතේ රු.17,383,481 ක් වටිනා මුදල්, යන්ත්‍ර හා උපකරණද, ආයෝජන මණ්ඩලය විසින් පවරා දී ඇති රු.555,618,000 ක් වටිනා ගොඩනැගිලි හා යටිතල පහසුකම්ද, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් රු.37,621,110 ක මුදලක්ද, කෘෂිකාර්මික චක්‍රීය ණය ලෙස රු.3,000,000 ක් ද, ලෙස එකතුව රු.113,622,591 ක් වටිනා දේපළ හා උපකරණ ලබාදී තිබුණද, වර්තමානය වන විට මෙකී කිසිදු අරමුණක් ඉටුවී නොතිබුණි.	ඉඩම මනාව සංවර්ධනය කිරීමට කටයුතු කරන ලෙස සී/ස හිරියාල ගොවිජන සමාගමේ සභාපති වෙත 2024 නොවැම්බර් 25 දිනැතිව දන්වා යවා ඇති බවත් මාස 06 ක් තුළ අපේක්ෂිත සංවර්ධනයන් නොකරන්නේ නම් අධිකරණ ක්‍රියාමාර්ග ඔස්සේ බදුකරය අවලංගු කිරීමට කටයුතු කරන බව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දී ඇති බව.	ළඟා කර ගැනීමට අදාළ අධීක්ෂණය හා පසු විපරම් නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, අපේක්ෂිත අරමුණු ඉටු නොවේනම් බදුකරය අවලංගු කර අරමුණු ඉටු කර ගැනීම සඳහා සුදුසු පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	දිස්ත්‍රික් ලේකම් විසින් කෘෂිකාර්මික චක්‍රීය ණය අරමුදලින් ලබාදුන් රු.3,000,000 ක ණය මුදලින් සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් රු.1,975,000 ක ශේෂයක් අයවීමට තිබුණි.	මෙතෙක් එම හිඟ ණය මුදල නිරවුල් කර ඇති බවක් නිරීක්ෂණය නොවන බව.	ණය මුදල් කාල ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට වගකිවයුතු නිලධාරීන් කටයුතු කළයුතුය.
(ඇ)	රජයේ ඉඩම් ආඥා පනතේ 454 අධිකාරිය සහ බදු ගිවිසුමේ 9 හා 10 වන වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම්ගේ හා ඉඩම් කොමසාරිස්ගේ පූර්ව අවසරයකින් තොරව අතුරු බදු දීමක් හෝ උප බදු දීමක් සිදු කල නොහැකි වුවත්, 2022 මැයි 22 දින සිට 2026 අගෝස්තු 31 දින දක්වා වසර 5 ක කාලයකට පළමු හා දෙවන වර්ෂ වලදී මාසිකව රු. 400,000 ක් බැගින්ද, තුන්වන හා හතර වන වර්ෂ වලදී රු. 420,000 බැගින්ද,	එම අතුරු බදු දීම නීත්‍යානුකූල කිරීමට අදාළ ලේඛන ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කරන ලද බවත් ඒ අනුව අතුරු බදුදීම් නීත්‍යානුකූල කිරීමෙන් පසු සහ එම බදු මුදල් අය කර ගන්නා ආකාරය සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින්	බදු ගිවිසුම කඩ කිරීම සම්බන්ධව නීති ප්‍රකාරව කටයුතු කිරීමට පියවර නොගත් නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, කඩිනමින් නීති

	පස්වන වසරේදී රු.540,000 බැගින් අය කිරීමේ කොන්දේසිය මත පෞද්ගලික සමාගමක් වෙත අතුරු බදු ලබාදීම හේතුවෙන් රජයට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි.	උපදෙස් ලද වහා ම එම මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව.	ප්‍රකාර කටයුතු කිරීමත් කළ යුතුය.
(ඈ)	ගොවි සමාගම විසින් ඔවුන්ගේ බදු අයිතිය උකසට තබා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් අවස්ථා 4 කදී රු.27,844,800 ක ණය මුදලක් ලබා ගෙන තිබුණි. මෙම ණය මුදල නොගෙවීම මත දඩ මුදල හා පොලිය ලෙස රු.68,866,556 ක මුදලක් බැංකුව වෙත ගෙවීමට දෙපාර්ශවය 2022 දෙසැම්බර් 29 දින එකඟ වී තිබුණද, එම එකඟතාවයට අනුව කටයුතු නොකිරීම හා සමාගම දිගින් දිගටම අලාභ ලබමින් පසුවන තත්වයක රු.113,622,591 ක් වටිනා උපකරණ හා දේපළ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත සින්න වීමේ අවධානමක් පැවතියද, මේ සම්බන්ධව බලධාරින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මෙම ඉඩමේ අපේක්ෂිත සංවර්ධනයන් සිදු නොකරන්නේ නම් හා තවදුරටත් බදු ගිවිසුමේ අනිකුත් කොන්දේසි උල්ලංඝනය වන අයුරින් කටයුතු කරන්නේ නම් බදුකරය අවලංගු කිරීමට අදාළ නිර්දේශ වාර්තාවන් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කිරීමට කටයුතු කරනු ලබන බව.	බදු ලබාදී ඇති ඉඩම්, උකස් කිරීම සම්බන්ධයෙන් රජයේ ඉඩම් ආඥා පනත ප්‍රකාරව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, අදාළ සමාගමට එරෙහිව කඩිනමින් නීතිමය පියවර ගැනීමත් කළ යුතුය.

4.8 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සෑම රජයේ ආයතනයක් විසින්ම ස්වකීය ඉඩම් දේපළ වල නම, පිහිටීම, වටිනාකම ඉදිකිරිම් හා සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කළ යුතු නමුත්, එවැනි ලේඛනයත් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව නොතිබීම හේතුවෙන් කුරුණෑගල නගරය අවට වසම් 04 ක බිම් ප්‍රදේශ වසර ගණනාවක් තිස්සේ අනවසර ඉදිකිරීම් වලට ගොදුරු වී ඇති බව නිරීක්ෂණය වූ අතර එම ඉඩම් රජයේ ඉඩම් (සන්තකය ආපසු ගැනීම) පනත යටතේ කටයුතු කර නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී ඒ සම්බන්ධව ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකර තීරණ ගැනීම සිදු කරන අතර මේ සියලු දෙනා සඳහා මහල් නිවාස යෝජනා ක්‍රමයක් විල්ගොඩ ඉදි කිරීමට යෝජනා වී ඇති බව පසුගිය සම්බන්ධීකරණ කමිටුවෙහිදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වන ලද බව.	ස්වකීය ඉඩම් දේපළ සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කළ යුතු අතර අනවසර ඉදිකිරීම් සම්බන්ධව කඩිනමින් නීත්‍යානුකූලව කටයුතු කළයුතුය.

(ආ)	නිසි සන්නිවේදන සහ සුදුසු ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 9 ක 2024 ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා ජොෂ්ඨ පුරවැසි දීමනා මුදල් වලින් රු.13,098,200 ක් අධිභාර කර තිබුණි.	චක්‍රලේඛය අනුව දීමනා ගෙවිය යුත්තේ සෑම මසකම 15 දින සිට වැඩකරන දින 7ක් තුල වුවත් නියමිත දින වලට ගෙවීමට ප්‍රතිපාදන නොලැබීම මත නිශ්චිත දිනයක් ප්‍රතිලාභීන් වෙත දැනුම්දීමට නොහැකිවීමෙන් අධිභාරවීම් සිදුවන බව.	ජොෂ්ඨ පුරවැසි දීමනා නිසි පරිදි ගෙවීමට කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, අදාළ පාර්ශව වෙත ප්‍රතිලාභ කාලීනව ලැබීම කහවුරු වන ක්‍රමයක් සැකසීමටත් පියවර ගත යුතුය.
(ඇ)	විශ්‍රාමික නිලධාරින් 725 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට වැඩිපුර ගෙවා ඇති රු.167,196,792 ක විශ්‍රාම වැටුපෙන් සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.105,206,932 ක මුදලක් අයකරගෙන තිබුණු අතර තවදුරටත් රු.84,576,516 ක මුදලක් අයකරගත යුතුව පැවතුණි.	කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 හි වැඩිපුර ගෙවූ විශ්‍රාම වැටුප් අයකර ගනිමින් පවතින අතර තවදුරටත් අයකර ගැනීමට ඇති ශේෂය රු.84,576,516 ක් බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවීම් නිලධාරීන්ගේ මැදිහත්වීමකින් සිදු කර තිබේද යන්න සොයා බලා අදාළ පියවර ගැනීමටත්, වැඩිපුර ගෙවීම් කඩිනමින් අයකර ගැනීමටත් පියවර ගත යුතුය.
(ඈ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක විශ්‍රාමිකයන් 16 දෙනෙකු සඳහා වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප්, නැවත අයකරගැනීමට පෙර එම විශ්‍රාමිකයින් මියයාම නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයකරගත නොහැකිව පවතින රු.3,217,115 ක විශ්‍රාම වැටුප් ශේෂය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් විම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් විමසීම් කලද, මේ වන තෙක් පිළිතුරක් ලබා දී නොමැති බව.	- එම -
(ඉ)	රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2024 මාර්තු 30 දිනැති අංක 06/2024(i) හා 2024 ජුලි 17 දිනැති අංක 06/2024(ii) දරන චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව අස්වැසුම වැඩසටහන, විමධ්‍යගත අරමුදල සහ අදාළ වන පරිදි කඳුකර දශකය, කෘෂි නව්‍යකරණ වැඩසටහන යනාදී අනෙකුත් සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් රු.15,000 ක දිරි දීමනාව සමාලෝචිත වර්ෂය තුළ අනුමත නිලධාරින් විසින් ලබා ගනිමින් සිටියදී, රාජ්‍ය	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2024 මාර්තු 28 දිනැති 06/2024 , 2024 මාර්තු 30 දිනැති 06/2024(i) හා 2024 ජුලි 17 දිනැති 06/2024(ii) දරන ලිපි මගින් 2014 ජනවාරි 21 දිනැති හා අංක EST/8/ALLOW/ 03/121 දරන ලිපිය අවලංගු කිරීමක් සිදු කර නොමැති බව.	අදාළ බලධාරීන් විමසා විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවීමක් සිදු වී ඇත්නම් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් 2014 ජනවාරි 21 දින නිකුත් කරන ලද අංක EST/8ALLOW/03/121 ලිපියේ 02 ඡේදය ප්‍රකාරව ග්‍රාමීය මට්ටමේ සංවර්ධන වැඩසටහන් දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමින් සම්බන්ධීකරණය කරමින් අධීක්ෂණය කිරීම වෙනුවෙන් 2024 මාර්තු සිට දෙසැම්බර් 31 දක්වා කාලයට අදාළව දීමනාව ලෙස එකතුව රු.1,376 ,919 ක් නිලධාරින් 30 දෙනෙකු විසින් තවදුරටත් ලබාගෙන තිබුණි.

5. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව 2030 වර්ෂය වන විට තිරසර සංවර්ධන අරමුණු 17 ක් ලඟාකර ගැනීමේ අරමුණින් කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රමවත් උපාය මාර්ගික සැලැස්මක් සකසා නොතිබුණු අතර එක් එක් වර්ෂ තුළදී අංශ විසින් ලබාදෙන කාර්යසාධන වාර්තා පදනම් කරගනිමින් තිරසර සංවර්ධන කාර්යසාධන සැලැස්මක් සකසා තිබුණි.	ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය පිලිබඳව පූර්වව නිශ්චය කල නොහැකි බැවින් ඉදිරි වර්ෂවලට අදාළව සැකැස්ම සකස් කර නොමැති බව.	2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව 2030 වර්ෂය වන විට තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමේ අරමුණින් කටයුතු කිරීමට පියවර ගත යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 13 ක් ද තෘතියික මට්ටමේ තනතුරු 3 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 16 ක් ද වශයෙන් මුළු තනතුරු 32 ක් පුරප්පාඩුව පැවති අතර ද්විතියික මට්ටමේ සේවකයින් 86 ක් අතිරික්තව පැවතුණි. පුරප්පාඩු පුරවා ගැනීමටත් අතිරික්ත සේවකයින් පුප්පාඩු පවතින ස්ථානවලට යොමු කිරීමටත් කටයුතු කර නොතිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 13 ක් ද තෘතියික මට්ටමේ තනතුරු 03 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 16 ක් ද වශයෙන් මුළු තනතුරු 32 ක් පුරප්පාඩුව පවතින අතර, ද්විතියික මට්ටමේ නිලධාරීන් 86 ක අතිරික්තයක් පවතින බව.	විධිමත් පරිදි කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර පුරප්පාඩු තනතුරු පුරවා ගැනීමටත්, අතිරික්ත නිලධාරීන් පුරප්පාඩු පවතින ස්ථානවලට අනුයුක්ත කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි.